

## නෙලූ පලා

ස්වර්ණකාන්ති රාජපක්ෂ

**කෝ නෙලූ පලා පොඩි නංගි**
**ඇයි අතහැරියේ ගිය පාරේ**
**සුදු ඕලු කුසුම   ඇත පරවී**
**ඉර අවරට ගිය හැන්දෑවේ**

**හඳ පායා එයි තව හීන් වෙලා**
**හොඳටම බොඳවී ඇත දිස්නේ**
**දිය කලය තබා ගිනි පුළිඟු මතින්**
**සුසුමෙනි නුඹ ලිප මොළවන්නේ**

**නුඹ පමාවැඩී ලතවෙවී   නොසිට**
**දැන් නිදාගනින්  නැගනියනේ**
**හිත දවටාගෙන සුබ සිහින සළුව**
**ඉරිමාවේ ඇහැරීපන්නේ**

## අවසර නැති තැන

**පුණ්‍යා ජයලත්**

හැරුණු හැරුණු අත මගෙ රුව සොයමින් වෙහෙසෙන බව   දනිමී
සිතට නැගෙන මගෙ පාළුව මකනට මමද වෙහෙස   දරමී
ඔබට නොපෙනි ඔබ පසු පස ඇදෙමින් නිරතුරු සෙවණ   දෙමී
වරම් නොමැත හමු වන්නට ඉඩ නැත අවසර නොමැත   හිමී

ඔබ සැතැපෙන කල ඉඳ ඉහ ඉද්දර මිහිරි වදන්   අමුණා
ගයන සිහින් ගී හඬක් ඇහෙනවද කණට මුමුණා   මුමුණා
නෙතට මුවෙ උවත් හිමියනි ඔබෙ උණුසුම මට   දැනුණා
මදුර අතීතය සිහව යලිත් මගේ නෙතට කඳුළු   පිරුණා

කෝප ගැණුන කළ වාද උණා අද වාගේ මටත්   මතකයි
සෝක කඳුළු පිසදා  යළි හිනැහී හාද උණා   මතකයි
ආදරයෙන් අවවාද දෙමින් දරුවන් තැනූ හැටි   මතකයි
තාම අඬනවද හිත හිත මා ගැන ඒක මටත්   නරකයි

එකතුව එකටම යන්නට පැතුවත් දෛවය හරස් වෙලා
අප දෙපසට කර දෙලොවක තනිකර යන මග වෙනස්   කලා
දුක සැප නොසැලී විඳගෙන සතුටින් සිටි හැටි මතක්   වෙලා
නොලැබෙන දෙයකට නොතැවෙමු දැන් අපි දෙතැනක   දුරස් වෙලා

සිතූ දේ වැලකෙයි නොපැතූ දෙයක් වෙයි පවතින දහම   එයයි
සිතුම් පැතුම් බොඳවී දියවන්නට වැඩි කාලයක්   නොයයි
අනිසයි මිහිපිට කිසිම දෙයක් තිර නැහැ නොතිරයි   අනිසයි
තන්හා ආසාවන් මැඩගත් කල සැනසුම ඔබට   ලැබෙයි

සසරට බැඳී මේ යදම් කඩා බිඳ බව බැමි සිඳ   බිඳලා
නොමැරෙන නොම ඉපදෙන ලොවකට යමු සසරින් එතෙර   වෙලා
ගැලවුම එතනයි නිම් නැති දුක් වේදනා වලින්   මිදිලා
පමා නොවෙමු හිමියෙනි හෙට අපටත් මොක් පුර දොර   ඇරිලා

## නුපුරුදු ය, නුරාගික කිතිකැවුම

රසික සූරියආරච්චි



ඩොලර් ශත ඇද හැලෙන
ණයපතෙන් මිණි කිකිණි හඬ නැගෙන
පායනා කාලයේ කුහුඹුවන් සැරි සරන
වස්සාන කාලයට ගබඩාව පුරවන්න දේ සොයන
හන්දියේ මහ කඩය මැද මහා දහවලේ, ගිලන් හද කිති කැවිණ
දශක දෙක හමාරක කාලයක අත් නොවිඳි අයුරකින්,
සිත නුරාවෙන් පිරිණ

ඉලිප්සාකාර වූ වුවනතක දෙතොල් පට දිග හැරී මද සිනාවක් නැගිණ
පෙළෙන සිත සුව කරන, ගිලන් හද පණ වඩන, අමා ඔසුවක් ලැබිණ
දෙනෙත නෙත, නෙත දෙනෙත, නිමේෂයකට ගැටිණ
විදුලි සර පැන නැගිණ, නෙක රිදී රූ ඇඳිණ
ගත පුරා පියාඹා යනු දැනිණ
ශ්වේතවන් වූ සමනල් රෑන!






## සරෝජා පොඩි නංගියේ

ආනන්ද ගුණතිලක  -  හොපර්ස් ක්‍රොසිං

**සයනයිඩ් කරලත් පැළඳගෙන මුකුළු පෑ එම වංගි   යේ**
**ගිණි බටය හරවලයි ඉවතට වෙනත් පසෙකට මං ගි   යේ**
**වෙඩි හඬට පොඩි අකුරු ඇද උන සරෝජා පොඩි නංගි   යේ**
**මගේ හදවත ඔබේ කැල්මට පෙම් කලේ ඒ සන්දි   යේ**

**ත්‍රස්තවාදී රැලම නැතිකර නිදහසේ හිස් ඔසව   ලා**
**දවස් කීයද විහිළු කර කර හිටියෙ දෙන්නා හිනැහි   ලා**
**බලය පිළිබඳ සිහින මවනා කපටි රැල දෙස බල බ   ලා**
**ඇගේ ලේ නැහැ මේ දවස් වල ඇහෙන තොරතුරු  සැලවෙලා**

**දහස් ගනණින් ලක්ෂ ගනණින් තවත් පිරිසක් මරා ගන්න   ට**
**දෙමළ සිංහල අපගෙ රුධිරෙන් ලක් මවගෙ ගත තෙමා ලන්නට**
**හිනා මුහුනෙන් රටම කොටවා මහා සඟ ගණ බිම  හෙලන්න ට**
**අළුත් ව්‍යවස්තා හදති උන් රටම යුද පිටියක් කරන්න   ට**

**දිනපු සාමයෙ පිහිට අරගෙන ඉන්න නම් අපි ආදරෙ   න්**
**ජාති නොබලා පක්ෂ නොබලා පිළි ගනිමු හැම සාදරෙ   න්**
**බේද වපුරන පව්ටු මිනිසුන් නැවත එලවමු ආ දෙරෙ   න්**
**බැංකු බිඳගෙන හොරා කති උන් රටේ මුදලට   න්**

**ඔබේ නෑයන් මගේ නෑයන් එකට එක්වෙන දිනය කොහි   දෝ**
**නිමා උන ඒ අඳුරු කාලය මකා ලන්නට අපට හැකි   දෝ**
**මගේ ගම වෙත ඔබව කැන්දන් එන්න වරයක් දෙවියො දෙයිදෝ**
**අපේ සෙනෙහස මිරිඟුවක් වී පිපෙන්නට පෙර පරව යයි   දෝ**

**තුරුළු වීලා එකම නිවසක ඔයා අම්මා කෙණෙක් උන   දෑ**
**මගේ පිරිවර ඔබේ පිරිවර එකම නෑ සිය පවුල වෙන   දෑ**
**ජාති ආගම් බේද පිළිබඳ සියළු සිතිවිලි සැවොම පර   දෑ**
**අපේ සමගිය අපිම ගොඩගමු බෙදුම් වාදී රැලම වල   දෑ**

## මතක සෙවනැලි

ප්‍රේමවංශ දසනායක

**වෙන්වී ගියද පෙරදින අප දිවි ගමනේ**
**ලංවී සිටිය මතකය කොඳුරයි සවනේ**
**තුන්යම රෑ පෙනී නොපෙනී යන සිහිනේ**
**සුන්බුන් අතර නෙත පැටලෙයි නිදි යහනේ**

**අතැඟිලි බැඳුනු අත පිබිදුනු නෙත ඇතිව**
**අරුණෝදයේ ලා හිරු රැස් හා කැටිව**
**පිය නැඟු ගමන තිබුනද මතකය සතුව**
**තනි මඟ ඇදෙන පා ඇත අද අඩපණව**

**දෙනෝදහක් සිටියද මඟතොට අවට**
**දැනේ තනිය කිසිදා නොදැනුන ලෙසට**
**සෙනේ පොදක ළඟ ඇසුරක උණුසුමට**
**සැනේකින් දිවේ සිත යලි මතකයට**

**වනතුරු වදුල එතෙනා ලියවැල සේම**
**නිරතුරු දැවට රෑ දාවල නොබලාම**
**හද පිරිමැදුන ලෙන්ගතුකම සබඳකම**
**සෙවනැල්ලක්ව ඇත මතකය හා තවම**